රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 05/97

මගේ අංකය: එක්ස්ටියු/2(111)/7,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1997 .ජනවාරි.31 වැනිදින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන
ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ නිලධාරීන් සඳහා රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම (අග්‍රහාර)

ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීන් සඳහා අංග 3 කින් සමන්විත වූ රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට රජය අනුමත කර ඇත.

1. වෛද්‍ය රක්ෂණ ක්‍රමය
2. පෞද්ගලික හදිසි අනතුරු ආවරණ රක්ෂණය (අනතුරු රක්ෂණය)
3. ණය සුරැකුම් රක්ෂණය.

මෙම රක්ෂණ ක්‍රමය සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය 1997.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වනු ඇත.

02. 1. වෛද්‍ය රක්ෂණ ක්‍රමය සඳහා සම්පූර්ණ වියදම් රජය මගින් දරනු ලබන අතර,එම රක්ෂණ ක්‍රමය සුදුසුකම් ඇති සියළුම රජයේ නිලධාරීන් වෙත රජයේ වියදමින් නොමිලේ ලබා දෙනු ලැබේ. මේ සඳහා රජයේ සියළුම සේවකයන් අනිවාර්යයෙන්ම රක්ෂණය කෙරේ. රජයේ සේවකයන් විසින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා දරනු ලබන වියදම් ඔවුන්ට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිපූරණය කරනු ලැබේ.

11. පෞද්ගලික හදිසි අනතුරු ආවරණ රක්ෂණය (අනතුරු රක්ෂණය) සහ ණය සුරැකුම් රක්ෂණය සඳහා නිලධාරියා විසින් මසකට රු. 11/- ක වාරිකයක් ගෙවිය යුතු අතර, මේ සඳහා ස්වකැමැත්තෙන් බැඳිය හැකිය.

03. ප්‍රතිලාභ:-

වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ ලැබෙන ප්‍රතිලාභ අංක 01 දරණ ඇමුණුමෙන් ද,පෞද්ගලික හදිසි අනතුරු ආවරණ රක්ෂණයේ (අනතුරු රක්ෂණය) ප්‍රතිලාභ අංක 02 දරණ ඇමුණුමෙන්ද, ණය සුරැකුම් රක්ෂණයේ ප්‍රතිලාභ අංක:03 දරණ ඇමුණුමෙන් ද දැක්වේ.

04. සුදුසුකම්:-

ස්වකීය තනතුරේ ස්ථිර කරනු ලැබ ඇති, අවු:18 සිට 60 වයස් සීමාව තුළ සිටින රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ ඕනෑම නිලධාරියකුට මේ යෝජනා ක්‍රමවලට බැඳීමට සුදුසුකම් ඇත. ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට බඳවාගත් නව ආධුනිකයිනට මෙම රක්ෂණ ක්‍රමවලට බැඳීමට සුදුසුකම් ලබන්නේ ඔවුන් එම පත්වීම්වල ස්ථිර කිරීමෙන් පසුවය.

05. ඇතුල්වීමේ ක්‍රමය:-

මෙම රක්ෂණ ක්‍රමවලට, බැඳෙන සියළුම අයදුම්කරුවන් විසින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත හැකි අංක 04 දරණ ඇමුණුමේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය, අනුව අයදුම් පත්‍රයක් සම්පූර්ණ කොට තම දෙපාර්තමේන්තු ප්‍රධානියාට භාර දිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එය සහතික කොට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක 21 දරණ ස්ථානයේ, රක්ෂණ මන්දිරයේ, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ, රාජ්‍ය සේවා රක්ෂණ දෙපාර්තමේන්තුවේ, කළමනාකාර තැන වෙත පහත සඳහන් විස්තර සමග උපලේඛනගත කොට යැවිය යුතුය.

I. අනුක්‍රමික අංකය
II. නම
III. තනතුර
IV. ලිපිනය

06. රක්ෂණ ඔප්පු නිකුත් කිරීම:-
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූලස්ථානය මගින් සිදුකෙරේ.

07. රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබාගැනීමේ ක්‍රමය

යම්කිසි රෝගයක්/අනතුරක් සිදුවූ විට එය සිදුවී දින 14ක් ඇතුලත ඒ බැව් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාට දන්විය යුතුය. සියළුම වෛද්‍ය උපදෙස් සහ බිල්පත් තම අයදුම්පත්වලට ඇමිණිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහත පරිදි එක් මසක් තුළ තමන් වෙත ලැබෙන සියළුම ඉල්ලීම් එකතු කොට ඊළඟ මාසයේ මුල් සතිය තුළ ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටා ඇති ඇමුණුම් **05** න් දක්වෙන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අදළ ප්‍රාදේශීය/ශාඛා කාර්යාලවලට යැවිය යුතුය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එම කාර්යාල මගින් එම සියළුම වවුචර් සඳහා එක් චෙක්පතක් ලියා අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත 02 වැනි සතියේ එවනවා ඇත. එසේ ලැබුණු චෙක්පත් අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තම" පොදු තැන්පත්ගිණුමේ" තැන්පත් කොට අදළ අයදුම්කරුවන් වෙත ඔවුන්ගේ ඉල්ලීම් වෙන වෙනම ගෙවිය යුතුය. මෙම කාර්යය පාලනය පහසු වනුවස් අදළ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් "පොදු තැන්පත් ගිණුම" යටතේ උප ගිණුමක පවත්වා ගෙන යායුතුය. රක්ෂණ ක්‍රමය සම්බන්ධයෙන් ලැබෙන සියළුම ලැබීම් සහ ගෙවීම් පිළිබඳ සටහන් එහි ඇතුලත් කළ හැකිය.

08. කාර්යාලීය පරිපාටිය:-

1. රක්ෂණ ක්‍රමයට ඇතුල්වීම සඳහා ඉල්ලුම්පත්‍රයක් අදළ ආයතනයේ ප්‍රධානියා වෙත භාරදිය යුතු, අතර එය ලේඛණයට ඇතුලත් කොට, ඔහු ඇතුලත් වීම සඳහා අපේක්ෂා කරන යෝජනා ක්‍රම, එම ලේඛණයේ සටහන් කරවීමට ආයතන ප්‍රධානියා ක්‍රියාකල යුතුය

11. ඔහු දෙවැනි හා තුන්වැනි රක්ෂණ ක්‍රමවලට ඇතුලත් වීමට ඉල්ලා සිටින්නේ නම් මාසික වාරිකය නිලධාරියාගේ වැටුපෙන් අඩුකරගෙන රක්ෂණ සංස්ථාවට ගෙවීම, ආයතන ප්‍රධානියා විසින් කල යුතුය.

111. දෙවැනි සහ තුන්වැනි රක්ෂණ ක්‍රමවලට බැඳී ඇති නිලධාරියකු, ස්ථාන මාරුවීමේදී නව සේවා ස්ථානයේ දී ඔහුගෙන් අයවිය යුතු මුදල අයකරගෙන රක්ෂණ සංස්ථාවට ගෙවීමට නව සේවා ස්ථානයේ ආයතන ප්‍රධානියා ක්‍රියා කළ යුතුය.

1V රක්ෂණ ඔප්පුව ලැබුණු විට එහි සහතික පිටපතක් පුද්ගලික ලිපිගොනුවට ඇතුලත් කොට මුල් පිටපත අයිතිකරුට භාරදිය යුතුය.

**09.** යම් නිලධාරියකු වෙනුවෙන් නිකුත් කරනු ලබන කවර හෝ රක්ෂණ ඔප්පුවක් ඔහු රජයේ සේවයෙන් ඉල්ලා අස්වන හෝ විශ්‍රාම යන හෝ ධූරය අත්හැර යන හෝ සේවයෙන් පහකරනු ලබන හෝ දිනයේ සිට බල නොපැවැත්වෙනු ඇත. එවැනි සියළුම ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැනීම්, සේවයෙන් පහකිරීම් හා ධූරය අත්හැරයාමේ සී/ස. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත නිවේදනය කළ යුතු අතර, එවැනි නිලධාරීන්ගේ රක්ෂණ ඔප්පු අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආපසු ගත යුතුය.

10. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/ආර්.එස්. ජයරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම (1)

ප්‍රතිලාභ

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය:-

(1) රෝහල්සහ සාත්තු නිවාස නඩත්තු ගාස්තු රු.16000/-
(දිනකට කාමර ගාස්තුව රු.500/- ක උපරිමයකට යටත්ව)

(2) උපදේශක විශේෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශ මත ලබාදෙන විශේෂ ප්‍රතිකාර හා හෙදසේවා සඳහා සහ රෝහල් සහ ආරෝග්‍යශාලා හා සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා යන වෛද්‍ය සහ ශල්‍ය කර්ම වියදම් හා ශල්‍යාගාර ගාස්තු රු.6500/-

(3) ශල්‍යකර්ම සඳහා ශල්‍ය හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු රු.12000/-

(4) පිලිගත් වෛද්‍යවරයෙකුගේ හෝ වෛද්‍ය සේවා ආඥා පනතේ 41 යටතේ ලියාපදිංචි කළ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත ආරෝග්‍යශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබාගැනීමේදී වෛද්‍ය උපදේශක සේවා හෝ විශේෂඥ වෛද්‍ය ගාස්තු සඳහා රු.7500/-

(5) සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ප්‍රතිකාර යන මේවා ඇතුළු විශේෂඥ සේවා රු.8,000/-

(6) ඉහත 1 සිට 5 දක්වා ප්‍රතිලාභ හිමි පුද්ගලයකුගේ හදිසි රෝගාබාධයකදී ජීවිතය බේරාගැනීම සඳහා පදිංචි ස්ථානයේ සිට ළඟම ආරෝග්‍යශාලාවට හෝ සාත්තු නිවාසයට ගෙනයාමට සිදුවුවහොත් ගමන් ගාස්තු රු.2,000/-

(7) සාමාන්‍ය දරු උපතකදී රු.3,000/-

(8) I. සාමාජිකයන් සඳහා පමණක් අචි කණ්නාඩි හැර වෛද්‍යවරයකුගේ නිර්දේශය මත වසර 05කට වරක් ඇස් කණ්නාඩි ලබාගැනීමට රු.2,000/-

II. අවුරුදු 02 කට වරක් කාච වෙනස් කිරීම සඳහා රු.2,000/-

(9) බාහිර ප්‍රතිකාර - දත් වෙනුවෙන් ලබාගන්නා ප්‍රතිකාරද ඇතුලත්ව රු2,000/-

(10) රජයේ රෝහලක වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නේ නම්(දින 30ක උපරිමයකට යටත්ව)
I. සාමාන්‍ය නිලධාරීන්ට රු. 250/- (දිනකට)
II. කළමනාකරණ තත්ත්වයේ නිලධාරීන්ට රු. 300/- (දිනකට)

එක් සිද්ධියක් සඳහා (උපරිමය) රු. 40,000/-

එක් වර්ෂයක් සඳහා (උපරිමය) රු. 50,000/-

පවුල් ඒකක:

විවාහක සේවකයින් : සේවකයා සහ යැපෙන අවිවාහක දරුවන් වයස අවුරුදු 21 ට අඩු

අවිවාහක සේවකයින් : සේවකයා සහ දෙමාපියන් (වයස අවු:70 දක්වා) හෝ සේවකයාගේ වයස අවුරුදු 21 ට අඩු අවිවාහක සහෝදරයින් සහ සහෝදරියන්.

ඇමුණුම් (2)

**ප්‍රතිලාභ**

**පුද්ගලික හදිසි අනතුරු සඳහා ආවරණ:-**

මෙම ක්‍රමය යටතේ නිලධාරියකු රාජකාරියට එන අතරදී හෝ රාජකාරියේ යෙදී සිටියදී හෝ රැකියාවෙන් බාහිරව සිටියදී හෝ රැකියාවෙන් පිටව නිවසට යන අවස්ථාවේදී හෝ දවසේ පැය විසිහතර තුළ ඕනෑම අවස්ථාවකදී සිදුවන අනතුරක් ආවරණය වේ.

**ලැබෙන ප්‍රතිලාභ**

1. රක්ෂණ ක්‍රමය ආවරණය, දවසේ පැය 24 පුරාම

11. උපරිම වයස් සීමාව අවුරුදු 60 දක්වා

111. රක්ෂිත මුදල - වර්ෂ 05 ක වැටුප

1V ගෙවනු ලබන මුදල

(අ) ස්ථිර අකර්මන්‍යතාවය:

| | |
|---|---|
| හදිසි අනතුරක් නිසා සිදුවන මරණයකදී) හෝ ස්ථිර පූර්ණ අකර්මන්‍යතාවයකදී ) | සම්පූර්ණ රක්ෂිත මුදල |

(ආ) ස්ථිර අර්ධ අකර්මන්‍යතාවය

| | |
|---|---|
| එක් පාදයක් අහිමිවීම, එක් ඇසක් ) අහිමිවීම, එක් අතක් අහිමිවීම ) | රක්ෂිත මුදලෙන් 50% |

(ඇ) තාවකාලික පූර්ණ අකර්මන්‍යතාවය

| | | |
|---|---|---|
| 1. සති 52 ක කාලයක් සඳහා | - | සතියකට රක්ෂිත මුදලෙන් 0.06% බැගින් |
| 11. තාවකාලික අර්ධ අකර්මන්‍යතාවය සති 52 ක කාලයක් සඳහා | - | සතියකට රක්ෂිත මුදලෙන් 0.0 % බැගින් |

(ඈ) ස්වභාවිකව සිදුවන මරණයකදී - රු. 10,000/-

ඇමුණුම් (3)

ප්‍රතිලාභ:-

ණය සුරැකුම් රක්ෂණය:-

මෙම රක්ෂණ ක්‍රමය මගින් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය යටතේ රජයේ සේවකයන් ලබා ගන්නා වූ නිවාස ණය, දේපළ ණය, වාහන ණය වැනි ඇපකරුවකු හෝ ඇපකරුවන් අවශ්‍ය වන සියලු ණය වර්ග ආවරණය වේ. යම් හෙයකින් රජයට අය විය යුතු ණය මුදලක් ණයකරුට ගෙවිය නොහැකි වූ විට, ණය මුදල රක්ෂණ සංස්ථාව විසින් රජයට ගෙවනු ලැබේ.

ප්‍රතිලාභ :-

I ණය ගැතියා රෝගාතුර වීමෙන් හෝ අනතුරකින් අර්ධ හෝ පූර්ණ අකර්මන්‍යතාවයකට පත්වී සුපුරුදු ජීවනෝපාය අහිමි වුවහොත්, හෝ ජීවිත හානියකට පත්වූ විට ණය මුදලේ ඉතිරි ශේෂය රජය ගෙවීමට රක්ෂණ සංස්ථාව බැඳී සිටී.

II ණය මුදල - ණය ගන්නා අවස්ථාවේ අවුරුදු 05 ක මාසික වැටුප්වල උපරිමය හෝ ලබාගන්නා මුදලේ වටිනාකම

III රක්ෂිත මුදල - ණය මුදලේ ඉතිරි ශේෂය

IV ණය මුදල ආපසු ගෙවීම - ආපසු ගෙවන කාලය වයස අවුරුදු 55 හෝ සේවය දීර්ඝ කර ඇති අවුරුදු 60 නොඉක්මවිය යුතුය.

ඇමුණුම් 04

## රජයේ නිලධාරීන් සඳහා රක්ෂණ ක්‍රමයට බැඳීමේ ඉල්ලුම්පත්‍රය

01. සාමාජිකයාගේ නම:-

02. දැනට දරණ තනතුර:-

03. 1. ජාතික හැඳුනුම්පත්අංකය:-
    11. වයස:-

04. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/
    පළාත් සභාවේ නම:-

05. ලිපිනය:-

06. සිවිල් තත්ත්වය:-

07. විවාහ වී නම් කලත්‍රයාගේ නම හා වයස:-

    අවු: 21 ට පහළ අවිවාහක දරුවන්ගේ නම්:-
    වයස

    1.
    2.
    3.

අවිවාහක නම්:-

පියාගේ නම :- වයස:-

මවගේ නම:- වයස-:-

වයස 21 ට අඩු රැකියා නොකරන තමන්ගෙන් යැපෙන සහෝදරයින්/
සහෝදරියන්:-
වයස
1.
2.
3.

08. ඔබ සහ අංක 7 යටතේ සඳහන් අය හොඳ
    සෞඛ්‍යය තත්ත්වයේ සිටින්ද? නැතිනම්
    සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

09. පුද්ගලික හදිසි අනතුරු ආවරණ රක්ෂණය සහ
ණය සුරැකුම් රක්ෂණය සඳහා රක්ෂණ ක්‍රමය
යටතේ ආවරණය වීමට ඔබ කැමැත්තෙහිද? කැමැතිය/අකැමැතිය.

මාසිකව රුපියල් 11/-ක වාර මුදලක් මගේ වැටුපෙන් අයකර ගැනීමට කැමැත්ත මෙයින් ප්‍රකාශ කරමි.

ඉහත සඳහන් ප්‍රකාශය සත්‍ය සහ නිවැරදි බව අප සහතික කර ප්‍රකාශ සිටිමු.

ඉල්ලුම්කරුගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

.................................................................................................................................................

අදාළ ගෙවීම් නිලධාරි,

මගේ මාසික වැටුපෙන් රුපියල් 11/- අඩුකර එම මුදල් කොළඹ 02, වොක්ෂෝල් වීදියේ පිහිටි සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පොදු අංශයේ රක්ෂණ ඒකකයට යවන්න.

ඇමුණුම (5)

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශාඛා කාර්යාල

| | දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය / ශාඛා කාර්යාලය |
|---|---|---|---|
| 1. | කොළඹ | ප්‍රධාන කාර්යාලය<br>අංක 21, වොක්ෂෝල් වීදිය | කොළඹ |
| 2. | ගම්පහ | ශාඛා කාර්යාලය | ගම්පහ |
| 3. | කළුතර | -එම- | කළුතර |
| 4. | මහනුවර | -එම- | මහනුවර |
| 5. | මාතලේ | -එම- | මහනුවර |
| 6. | නුවරඑළිය | -එම- | මහනුවර |
| 7. | ගැල්ල | -එම- | ගාල්ල |
| 8. | මාතර | -එම- | මාතර |
| 9. | හම්බන්තොට | -එම- | මාතර |
| 10. | කුරුණෑගල | -එම- | කුරුණෑගල |
| 11. | පුත්තලම | -එම- | මීගමුව |
| 12. | අනුරාධපුරය | -එම- | අනුරාධපුරය |
| 13. | පොළොන්නරුව | -එම- | අනුරාධපුරය |
| 14. | බදුල්ල | -එම- | බදුල්ල |
| 15. | මොණරාගල | -එම- | බදුල්ල |
| 16. | රත්නපුර | -එම- | රත්නපුර |
| 17. | කෑගල්ල | -එම- | කෑගල්ල |
| 18. | යාපනය | ප්‍රාදේශීය කාර්යාලය | යාපනය |
| 19. | කිලිනොච්චිය | -එම- | අනුරාධපුරය |
| 20. | මන්නාරම | -එම- | අනුරාධපුරය |
| 21. | වවුනියාව | -එම- | අනුරාධපුරය |
| 22. | මුලතිව් | -එම- | ත්‍රිකුණාමලය |
| 23. | මඩකලපුව | -එම- | මඩකලපුව |
| 24. | අම්පාර | ශාඛා කාර්යාලය | අම්පාර |
| 25. | ත්‍රිකුණාමලය | ප්‍රාදේශීය කාර්යාලය | ත්‍රිකුණාමලය |